## අපි පෙනී සිටින්නේ කුමක් සඳහා ද?

ශ්‍රී ලංකා සමාජවාදී පක්ෂය ජනවාර්ගිකත්වය , උපන් ස්ථානය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ ආගම නොසලකා ලාංකේය සමාජයේ සමස්ත වැඩ කරන ජනතාවගේ පූර්ණ සමාන ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සපුරා ගැනීමට කැප වී සිටී. පසුගිය සිවිල් යුද්ධ සමයේ සිට හඳුන්වා දෙන ලද සියලු මර්දන නීති අහෝසි කිරීමට හා එම නීති යටතේ සිරගත කර සිටින සියලු දෙනා වහා ම නිදහස් කරන ලෙස ඉල්ලා සිටිමු.

කෙසේ වුවද ධනවාදය යටතේ සමානාත්මතාවය කිසිදාක සම්පූර්ණ හෝ ස්ථාවරව මුදුන් පමුණුවා ගත නොහැකි ය. පාර්ලිමේන්තු ක්‍රමයේ හිස් දේශපාලන පිළිවෙත්වලට අපව සීමා වී සමාජ සාධාරණත්වය මුදුන්පත් කර ගැනීමට හැකි වන්නේ නැත. මාක්ස්වාදී විග්‍රහයන්ට අනුව වත්මන් ධනේෂ්වර සමාජය ඇතුලත එය පෙරළා දැමීම සඳහා ඇතිවන සියලු අරගලවලට අපි අඛණ්ඩව මැදිහත් වෙමු. එවැනි අරගලයන් ඉදිරියට ගෙන යාම සඳහා ජාතික සීමා මායිම් තුළ රැඳී නොසිටින අතර, අප අපගේ බලවේග එම අරගලයන් ඉදිරියට ගෙන යාම සඳහා ඉන්දියාවේ අසල්වැසි රටවල් සමඟද ලොව පුරා වැඩ කරන බලවේග සමඟ එම සටන් බද්ධ කිරීමට කටයුතු කරන්නෙමු. මෙය නිර්වචනය කරන්නේ නම් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් යටතේ තිරසාර ධනේෂ්වර සංවර්ධනයක් වෙනුවට ස්ථාවර සමාජවාදී සැලසුම්ගත ආර්ථිකයක් ගොඩ නැගිය යුතු බව අවධාරණය කරමු. (තනි රටක සමාජවාදී පාලනයක් වෙනුවට ට්‍රොට්ස්කි විසින් අවධාරණය කරන ලද නොනවතින විප්ලවය මත පදනම් ක්‍රියාවට නැගීම) මෙම උපාය මාර්ගය මත පදනම් වෙමින් අපි ප්‍රජාතාන්ත්‍රික අයිතීන් සඳහා වන අරගලය ධනවාදයට එරෙහි අරගලය සමඟ ඒකාබද්ධ කිරීම සඳහා සටන් වදිමු. එසේම ධනපති ක්‍රමය තුළ මතුවන ආර්ථික අසාධාරණය , සමාජ අසාධාරණය , පාරිසරික විනාශය ගොවි ජනතවාගේ හා සෙසු පීඩිත ජනතාවගේ ගැටලු සඳහා අප විසින් ස්ථිරසාර විසඳුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරමු.

එපරිද්දෙන් ම අපි කම්කරු පන්ති දේශපාලන අරගලයේ විප්ලවීය විධික්‍රම, නිර්ධන පංතිය මහජන බල මුළු ගැන්වීම මහජන සහ මහා වැඩ වර්ජන , හදිසි සහ ප්‍රජාතන්ත්‍රීය ඉල්ලීම් මුදුන්පත් කර ගැනීමේ ක්‍රම භාවිත කිරීම අවශ්‍ය යැයි විශ්වාස කරමු. අරගලයේ ඉහල ලක්ෂයේ දී කම්කරු සභා සහ ෆැක්ට්‍රි කමිටු වැනි කම්කරු පන්ති දේශපාලන ආයතන නිර්මාණය කිරීම අවශ්‍ය වේ. එසේම එයින් එවැනි ආයතන ආරක්ෂා කිරීමේ මාධ්‍යයන් ගොඩ නැගීමේ හා කම්කරු ආරක්ෂක ඒකක හා අවසානයේ දී කම්කරු මිලීෂියාවක් හරහා ඒවායේ තීරණ ක්‍රියාත්මක කිරීම ද අදහස් කරයි. අපේ අරමුණ කම්කරුවන්ගේ සහ කුඩා ගොවීන්ගේ ආණ්ඩුවක් හා බහු ජනතාවගේ අවශ්‍යතා සපුරාලිය හැකි සම්පූර්ණ සමාජගත කළ හැකි සැලසුම්ගත ආර්ථිකයක් විය යුතු ය.

මෙම අරමුණ මුදුන් පමුණුවා ගත හැක්කේ විප්ලවීය කම්කරු පංති බහුජන පක්ෂයක නායකත්වය පමණක් යටතේ වන අතර එවැනි පක්ෂයක් ගොඩ නැගීම සඳහා අපි පෙනී සිටිමු.

ඉදිරි අරගලයේ දී දිග හැරෙන දේශපාලන වර්ධන පෙර ගෙන යාම සඳහා පහත සඳහන් පරිදි සටන් පාඨ පෙළ ගස්වා ගත යුතුව තිබේ.

- ඇමරිකාව, චීනය, ඉන්දියාවේ ප්‍රමුඛ රටවලින් තබා ගෙන තිබෙන ණය ඇතුලු සියලු විදේශ ණය වහාම අහෝසි කරමු.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුලු මූල්‍ය සංවිධානය විසින් අටවන මර උගුලෙන් ගැලවීමට බල කරමු.

- රට පුරා මතුවන ජනතා අරගල ඒකාබද්ධ කර ගනිමින් කම්කරුවන් , ගොවීන් ඇතුලු පීඩිත සමාජ බලවේග බලමුළු ගැන්වීමට කටයුතු කිරීම ද එම ජන කොටස් නියෝජනය වන පරිදි ව්‍යවස්ථාදායක සම්පාදන මණ්ඩලයක් ගොඩ නැගීමට බල කරමු.

- ස්වයංනිර්න අයිතිය මත පදනම් වී ජාතික ප්‍රශ්නයට විසඳුම් ලබා දීම

- විධායක ජනපති ධූරය වහා අහෝසි කර රනිල් රාජපක්ෂ පාලනය කපෝති කරනු !

- සියලු මර්ධන නීති අහෝසි කිරීම

- ජනතාවට සංවිධානය වීමට ඇති අයිතිය අදහස් පල කිරීමට ඇති අයිතිය තහවුරු කරමු.

- සියලු දේශපාලන සිරකරුවන් නිදහස් කිරිම

- වත්මන් රනිල් රාජපක්ෂ පාලනයට සටන් වදින ජනතාවට සහයෝගය ලබා දීම සඳහා හමුදාවට සහ පොලීසියට ආයාචනය කිරිම සහ හමුදාවේ පහල කොටස් හා පොලීසිවල තෝරාගත් නියෝජිතයන්ගෙන් සමන්විත කමිටු ගොඩ නගමු.

- ලාංකීය ජනතා අරගලය පෙරට ගෙන යාම සඳහා දකුණු ආසියානු රටවල ජීවත්වන වැඩ කරන ජනතාවගේ සහයෝගය ලබා ගනිමින් සමාජවාදී කලාපීය බලයක් සඳහා සටන් වදිමු.

- දකුණු ආසියානු සමාජවාදී සමූහාණ්ඩුවක් සඳහා සටන් වදිමු.